# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 66 දරන
# ආරක්ෂක බදු (සංශෝධන)
# පනත

---

[සහතිකය සටහන් කළේ 1992 දෙසැම්බර් මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 දෙසැම්බර් මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ **කරන** ලදී.

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.**

---

කොළඹ 7 රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : ශත 90 යි.** තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1992 අංක 66 දරන ආරක්ෂක බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1992 දෙසැම්බර් මස 24 වන දින]

එල්. ඩී.—ඕ. 86/92

**1991 අංක 52 දරන ආරක්ෂක බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1992 අංක 66 දරන ආරක්ෂක බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1991 අංක 52 දරන ආරක්ෂක බදු පනතේ දීර්ඝ නාමයේ "1992 ජනවාරි මස 1 වන දිනෙන් ආරම්භ වන" යන වචන හා ඉලක්කම් වෙනුවට "පිළිවෙලින් 1992 ජනවාරි මස 1 වන දිනයෙන් සහ 1993 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂය සඳහා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1991 අංක 52 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "1992 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂයේ සෑම කාර්තුවක් සඳහා," යන වචන හා ඉලක්කම් වෙනුවට "පිළිවෙලින් 1992 ජනවාරි මස 1 වන දිනයෙන් සහ 1993 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂවල සෑම කාර්තුවක් සඳහා," යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. (1992 අංක 36 දරන ආරක්ෂක බදු (සංශෝධන) පනතින් ඇතුළත් කරන ලද) ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනයේ "පිළිවෙලින් 1992 ජූලි මස 1 වන දිනෙන් සහ 1992 ඔක්තෝබර් මස 1 වන දිනෙන් ආරම්භ වන කාර්තුව සඳහා" යන වචන හා ඉලක්කම් වෙනුවට "1992 ජූලි මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1994 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම කාර්තුවක් සඳහා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.